# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1889/32 – 2014 නොවැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2014.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

නිවේදනයයි

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ප්‍රසන්න රණතුංග වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහ නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1578/4 හා 2008 දෙසැම්බර් 01 දිනෙන් *ගැසට් පත්‍රයේ* සඳහන් 2008.12.01 වැනි දිනැති නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා
ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

**නියෝග**

01. මෙම නියෝග බස්නාහිර පළාතේ මහ නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට සහ සභිකයින්ට දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

02. බස්නාහිර පළාතේ මහ නගර සභා සඳහා තේරීපත් වන මහ නගර සභා නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට හා සභිකයින්ට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | | |
|---|---|---|
| නගරාධිපති | - | රු. 30,000.00 |
| නියෝජ්‍ය නගරාධිපති | - | රු. 25,000.00 |
| සභික | - | රු. 20,000.00 |


1A - PG 2253— 65 (2014/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී මහ නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

i. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම.
ii. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.
iii. කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

03. (2) මෙම නියෝගයේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරී කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවීමේ හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතු ය.

12-178/1

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### නිවේදනයයි

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ප්‍රසන්න රණතුංග වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1399/5 හා 2005 ජුනි 27 දිනෙන් ගැසට් පත්‍රයේ සඳහන් 2005.06.27 වැනි දිනැති රීති පරිච්ඡින්න කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා
ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

### රීති

01. මෙම රීති බස්නාහිර පළාතේ නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. බස්නාහිර පළාතේ නගර සභා සඳහා තේරීපත් වන නගර සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයින්ට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | | |
|---|---|---|
| සභාපති | - | රු. 25,000.00 |
| උප සභාපති | - | රු. 20,000.00 |
| සභික | - | රු. 15,000.00 |

03. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී නගර සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

i. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම.
ii. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.

iii. කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

03. (2) මෙම රීතියේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරී කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවීමේ හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතු ය.

12-178/2

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

**නිවේදනයයි**

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ප්‍රසන්න රණතුංග වන මා විසින්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2014.11.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එදිනට පෙර දින සිට ක්‍රියාත්මක වන පරිදි කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1399/5 හා 2005 ජූනි 27 දිනෙන් ගැසට් පත්‍රයේ සඳහන් 2005.06.27 වැනි දිනැති රීති පරිච්ඡින්න කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා
ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

**රීති**

01. මෙම රීති බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සඳහා තේරීපත් වන ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයින්ට පහත සඳහන් පරිදි වූ දීමනාවක් 2014 නොවැම්බර් 01 වැනි දින සිට ගෙවිය හැකි වේ.

| | | |
|---|---|---|
| සභාපති | - | රු. 25,000.00 |
| උප සභාපති | - | රු. 20,000.00 |
| සභික | - | රු. 15,000.00 |

03. (1) පහත සඳහන් අවස්ථාවන්හිදී ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු, සභිකවරයෙකු යථෝක්ත දීමනා සඳහා හිමිකම් නොලබයි.

i. සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම.
ii. සභාවෙහි කාර්යයන්ට පරිබාහිර වූ පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගතව සිටීම.
iii. කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම්භාරයේ සිටීම හෝ සිරගත වී සිටීම.

03. (2) මෙම රීතියේ I ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු හෝ සභිකවරයෙකු රාජකාරී කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරත වන අවස්ථාවක සභා රැස්වීමට හෝ කාරක සභා රැස්වීමකට සහභාගී නොවීමේ හේතුව මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතු ය.

12-178/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.